**ඔඞ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගය සහ මුලතිව් - පුලියන්කුලම මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා වූ උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---

ඔඞ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගය සහ මුලතිව් - පුලියන්කුලම මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහා වූ උතුරු මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංර) සහ චීන අපනයන හා ආනයන බැංකුව අතර 2010 සැප්තැම්බර් 09 දින එළඹි අංක බීඑල්ඒ 201006 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘති කාර්යයන් ජාතික මට්ටමේ කළමනාකරණ සහ සම්බන්ධීකරණ කිරීමේ වගකීම මාර්ග සංවර්ධන අධිකාරිය දරයි. ඔඞ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගය සහ මුලතිව් - පුලියන්කුලම මාර්ගයේ කිලෝමීටර් 52.6 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම එජඩො මිලියන 50.01 ක් වූ අතර ඉන් එජඩො මිලියන 42.51 ක් හෙවත් සියයට 85 ක් මූල්‍යයනය කිරීමට චීන අපනයන - ආනයන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ මූලික වැඩ 2010 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2014 පෙබරවාරි 14 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ඉදිකිරීම් වැඩ 2014 ජුනි 27 සම්පූර්ණ කර තිබුණු අතර මාර්ගයේ පුනරුත්ථාපනය කළ කොටස මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරිමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව,මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව, මාර්ග සංවර්ධන අධිකාරියේ පොදු කාර්ය පිරිවැය අයකිරීමක් ලෙස රු.635,169 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ප්‍රේෂණය කර තිබුණි. තවද එකී චක්‍රලේඛයේ 8.6 වගන්තියට පටහැනිව, ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට රු.87,841 ක් වූ ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි. ඉහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා මාගේ පෙර විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණද, ඒ සඳහා පිළියම් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදීද අඛණ්ඩව එම පරිචයන් සිදු කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) |
| චීන අපනයන ආනයන බැංකුව | 42.51 | 5,082.69 | 10.47 | 1,370.41 | 42.51 | 5,323.99 |
| ශ්‍රී.ලං.ර. | 7.50 | 1,048.19 | 0.15 | 19.73 | 7.52 | 980.39 |
| | **50.01** | **6,130.88** | **10.62** | **1,390.14** | **50.03** | **6,304.38** |

**3.2 භෞතික කාර්යසාධනය**

**-------------------------**

කිලෝමීටර් 52.6 ක් වූ මුලතිව් - පුලියන්කුලම මාර්ගයේ සහ ඔඩ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගයේ පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ වැඩ 2011 අගෝස්තු 15 දින ආරම්භ කර අවසන් කර තිබුණු අතර 2013 ජුනි 27 මාර්ග සංවර්ධන අධිකාරියට භාරදෙන ලදී. කෙසේ වෙතත් ඔඩ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගයේ 2014 දෙසැම්බර් 31 වන විටත් බෝක්කු (culverts) 39 ක පුනරුත්ථාපන වැඩ සිදුකර නොතිබුණු අතර, මුරගල් (Guard stones) 156 ක්ද සවිකර නොතිබුණු බව වැඩබිම් පරීක්ෂාවේදී අනාවරණය විය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පොදු කොන්දේසි 14.9 වගන්තිය අනුව, දෝෂ වගකීම් කාලය ඉකුත් වීමෙන් පසුව රඳවා ගැනීම් මුදල්, කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා ඉංජිනේරු විසින් සහතික කළ යුතුය. කෙසේ වුවද 2014 ජුනි 27 දින දෝෂ වගකීම් කාලය අවසන් වීමට පෙර බැංකු ඇපකරයක් ලබාගැනීම මඟින් රඳවා ගැනීම් මුදල් වලින් කොටසක් වූ රු.මිලියන 143.53 ක් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී මුදා හැර තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුළත් කරන ලද විධිවිධානයන්ට අනුව ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල්වලින් ප්‍රසම්පාදනය කර සිවිල් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන් භාවිතා කරන ලද වත්කම් ව්‍යාපෘතියේ වත්කම් ලෙස සැලකිය යුතුය. කෙසේ වුවද ණය මුදල් වලින් කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රසම්පාදනය කරන ලද වාහන, උපකරණ, ලී බඩු ආදී වත්කම්වල වටිනාකම වෙනම හඳුනාගෙන ව්‍යාපෘතියේ වාර්තාවලට ගෙන නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගංවතුර නිසා හානි වූ නැගෙනහිර පළාතේ කිලෝමීටර් 5.5 ක ත්‍රිකුණාමල - පුල්මුඩේ මාර්ගය සහ කිලෝමීටර් 9.3 ක පරාක්‍රමපුර පාදෙනිය මාර්ගයේ පුනරුත්ථාපන වැඩ පිළිවෙලින් රු.මිලියන 71 ක් සහ රු.මිලියන 289 ක් වැයකරමින් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව පුදුකුඩුඉරිප්පු නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ අනෙකුත් මාර්ගවලද පුනරුත්ථාපන වැඩ රු.මිලියන 581 ක පිරිවැයක් දරා සිදු කර තිබුණි. ඉහත වැඩ ව්‍යාපෘතියේ මුල් විෂය පථයට ඇතුළත් නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) කිලෝමීටර් 52.6 දිග ඔඩ්ඩුසුඩාන් - නැදුන්කේර්නි මාර්ගයේ සහ මුලතිව් පුලියන්කුලම මාර්ගයේ පදික මාර්ග පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රමාණ පත්‍රවල අයිතම 4 යටතේ රු.මිලියන 2,517.25 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද 2014 පෙබරවාරි 13 දක්වා ඉදිරිපත් කරනලද අතුරු ගෙවීම් සහතික වලට අනුව රු.මිලියන 734.81 ක මුදලක් පමණක් වැයකර තිබුණි. තවද ප්‍රමාණ පත්‍ර තාත්විකව පිළියෙල කර නොතිබූ අතර ප්‍රමාණ පත්‍ර වැඩි කොට දැක්වීම මත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග පුනරුත්ථාපන වැඩ 2014 ජුනි 27 දින අවසන් කර තිබුණද මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු.මිලියන 4.49 ක විශේෂ ණය මුදලක් ලබාගෙන තිබුණි.